තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව ඉදිරිපිට දී ය

**ඩබ් ඒ පී දිල්රුක්ෂි එ ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානය**

RTIC Appeal (පුද්ගලික වශයෙන් විභාග කිරීම)/136 /2018 (20.04.2018 දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේදී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය).

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචන කාර්යාා පටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යාා පටිපාටිය.

**සභාපති:** මහින්ද ගම්මම්පිල
**කොමිෂන් සභා සමාජික:** ජොෂ්ඨ නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන
**කොමිෂන් සභා සමාජික:** ජොෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සමාජික:** ආචාර්ය සෙල්වි තිරුචන්ද්‍රන්
**කොමිෂන් සභා සමාජික:** විනිසුරු රෝහිණී වල්ගම

**අධ්‍යක්ෂ-ජනරාල්:** පියතිස්ස රණසිංහ

**අභියාචක** - ඩබ් ඒ පී දිල්රුක්ෂි
**නොතිසි ලත් පාර්ශවය** - අධ්‍යක්ෂ ජනමාධ්‍ය ශ්‍රී ලංකා යුද්ධ හමුදාව

**පෙනීසිටීම**

අභියාචක - ඩබ් ඒ පී දිල්රුක්ෂි
එන් එච් ජී ද සිල්වා
පොදු අධිකාරිය - එල් එම් එම් ලියනගේ නීති නිලධාරී
ඩබ් එච් සොයිසා විෂය නිලධාරී

| | |
|---|---|
| තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය | 2017.02.13, 2017.05.21, 2017.08.09 |
| තොරතුරු නිළධරයා තීරණය ලබා දුන් දිනය | 2017.08.22 |
| නම් කල නිළධරයා වෙත අභියාචනය යොමු කළ දිනය | 2017.10.02 |
| නම් කල නිළධරයා තීරණය ලබා දුන් දිනය | 2017.11.25 |
| තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත අභියාචනය යොමුකළ දිනය | 2017.11.14 |

**අභියාචනයට පසුබිම්වූ කරුණු:**

අභියාචක 2017.02.13, 2017.05.21 සහ 2017.08.09 දිනැති තොරතුරු ඉල්ලීම් මගින් අභියාචකගේ ස්වාමිපුරුෂයා සම්බන්ධ පොදු අධිකාරිය විසින් නිකුත් කරන ලද/ සන්තකයේ ඇති නියෝග/ තොරතුරු/ විස්තර ඉල්ලා සිටින ලදී.
2017.11.15 වන දින දරණ ලිපි ආවරණය යටතේ ඉදිරිපත් කළ 07/2014 දරණ හමුදා නියෝගහි පහත අඩුලුහුඩුකම් සහිත බව අභියාචක පවසා සිටියි. 2017.11.15
1. ඡේද අංක 2 ආ (3)හි සඳහන් හමුදා හැසිරීම යනු කුමක්දැයි එම නියෝගයේ සවිස්තරාත්මකව සඳහන් කර නොතිබීම
2. එම නියෝගයේ ඡේද අංක 40 ට අනුව මෙම නියෝගයට ඇමුණුම් 4ට වඩා තිබිය යුතු වුවද එම ඇමුණුම් අභියාචක වෙත ලබා නොදීම
යුධ හමුදාව වෙත ආධුනිකයින් බඳවා ගත පසු ඔවුන් සමුහයක් ලෙස අදාල මුලික පාඨමාලවට යොමුකරවන අතර ඉන් සමත්වන අයවලුන් හට උසස්වීම් ලබා දෙනුයේ පාඨමාලා අනුපිළිවෙලට බවත්
අදාළ පාඨමාලාව උසස් වීම් ලබා දෙන අවස්ථාව වන විට යුධ හමුදා පනත හෝ වෙනත් ලිඛිත නීතියක් යටතේ චෝදනා ලබා යම් විමර්ශනයකට හෝ මු.පා.උ. කටයුත්තකට භාජනය වී සිටින එම විමර්ශනය අවසන් වීමට ප්‍රථම උසස් වීම් ලබාදීම මෙම නියෝග වලට අනුකූලද?
උදා: සෙ / 751128 සැරයන් දසනායක DMYGA යන අය මා/සහයන් තනතුරට උසස් කරන අවස්තවී යුධ හමුදා පොලීසිය, එකක මු.ප.උ. සහ මානව හිමිකම් කොමිෂන් සභාව යන ආයතන තුනම එකවිට විමර්ශනයක් සිදුකරමින් තිබියදී උසස් වීම් ලබාදීම නීතියට අනුකූලද සහ යුධ හමුදාවේ වෙනත් සෙසු නිලයන්ටද, එසේ විමර්ශන පවතිද්දී උසස්වීම් ලබා දෙනවාද?

තොරතුරු නිලධාරියා 2017.08.22 දිනැතිව පිළිතුරු සපයමින් පවසා සිටියේ ඉල්ලා ඇති තොරතුරු අලලා මානව හිමිකම් කොමිෂන් සභාවේ නඩුවක් ගොනුවී ඇති බැව් තහවුරු වන බවත් ඉල්ලා ඇති තොරතුරු සහ විස්තර යුධ හමුදා රහස්‍ය ලිපි ඝණයට ගැනෙන බැවින් ඒවා පිටතට ලබාදීමේදී නීතිමය පිළිවෙතක් අනුගමනය කළ යුතුව ඇති බවත්ය. ඒ හේතුවෙන් ඉල්ලා ඇති තොරතුරු මානව හිමිකම් කොමිෂන් සභාව වෙතින් හෝ නඩුව විභාග කෙරෙන ගරු අධිකරණය වෙතින් නියෝගයක් ලබාදුනහොත් ලබාදීමට හැකි බව දන්වා ඇත. මෙම ප්‍රතිචාරයෙන් අතෘප්තියට පත් අභියාචක 2017.10.02 දිනැතිව නම්කළ නිලධරයා වෙත අභියාචනයක් යොමු කරන ලදී. නම්කළ නිලධාරයාද පනත ප්‍රකාරව නියමිත කාලය තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වූ බැවින් අභියාචක 2017.11.14 දිනැතිව කොමිෂන් සභාව වෙත අභියාචනයක් යොමු කරන ලදී.

නම්කළ නිලධරයා 2017.11.15 දිනැතිව ප්‍රතිචාර දක්වමින් 07/2014 දරණ හමුදා නියෝග ලබා දී ඇත. 2017.11.15 වන දින දරණ ලිපි ආවරණය යටතේ ඉදිරිපත් කළ 07/2014 දරණ හමුදා නියෝගයෙහි පහත අඩුලුහුඩුකම් සහිත බව අභියාචක පවසා සිටියි.

*1. ඡේද අංක 2 ආ (3)හි සඳහන් හමුදා හැසිරීම යනු කුමක්දැයි එම නියෝගයේ සවිස්තරාත්මකව සඳහන් කර නොතිබීම*
*2. එම නියෝගයේ ඡේද අංක 40 ට අනුව මෙම නියෝගයට ඇමුණුම් 4ට වඩා තිබිය යුතු වුවද එම ඇමුණුම් අභියාචක වෙත ලබා නොදීම*
*යුධ හමුදාව වෙත ආධුනිකයින් බඳවා ගත පසු ඔවුන් සමුහයක් ලෙස අදාල මුලික පාඨමාලවට යොමුකරවන අතර ඉන් සමත්වන අයවලුන් හට උසස්වීම් ලබා දෙනුයේ පාඨමාලා අනුපිළිවෙලට බවත් අදාළ පාඨමාලාව උසස් වීම් ලබා දෙන අවස්ථාව වන විට යුධ හමුදා පනත හෝ වෙනත් ලිඛිත නීතියක් යටතේ චෝදනා ලබා යම් විමර්ශනයකට හෝ මු.පා.උ. කටයුත්තකට භාජනය වී සිටින එම විමර්ශනය අවසන් වීමට ප්‍රථම උසස් වීම් ලබාදීම මෙම නියෝග වලට අනුකූලද?*
*උදා: සෙ / 751128 සැරයන් දසනායක DMYGA යන අය මා/සහයන් තනතුරට උසස් කරන අවස්ථාවේ යුධ හමුදා පොලීසිය, එකක මු.ප.උ. සහ මානව හිමිකම් කොමිෂන් සභාව යන ආයතන තුනම එකවිට විමර්ශනයක් සිදුකරමින් තිබියදී උසස් වීම් ලබාදීම නීතියට අනුකූලද සහ යුධ හමුදාවේ වෙනත් සෙසු නිලයන්ටද, එසේ විමර්ශන පවතිද්දී උසස්වීම් ලබා දෙනවාද?*

**අභියාචනය සලකා බලන අවස්ථාවේදී උද්ගතවූ කාරණා:**

අභියාචනය අවස්ථාවේදී අභියාචක පවසා සිටියේ තම ස්වාමි පුරුෂයා සහ වෙනත් නිලධාරියකු අතර සිදුවූ පහර දීමක් හේතුවෙන් අසාධාරණ ලෙස තම ස්වාමිපුරුෂයාට පමණක් චෝදනා නාග තිබුනද අනෙක් නිලධාරියට උසස්වීම් දෙකක් ලබා දී ඇති බවත් එම සිද්ධියට සම්බන්ධව සිදු කරන ලද පරීක්ෂනවලට අදාළව තොරතුරු ඉල්ලා සිටින බවත් දැනට ලබාදී ඇති තොරතුරු අසම්පූර්ණ බවත්ය. තවද මෙම කාරණය

සම්බන්ධයෙන් විනය පරීක්ෂනයක් සිදු වෙමින් පවතින අවස්ථාවක උසස් වීම් ලබා දීමේ හැකියාවද අභියාචක ප්‍රශ්න කර සිටින ලදී.
පොදු අධිකාරිය ඉල්ලා ඇති සමහරක් ලේඛන රහස්‍ය ලේඛන බැවින් ලබා දීමට එකඟවී නැත. එම ලේඛන අභියාචකට අවශ්‍ය බව පවසා සිටින ලදී.

තවද ඇමුණුම් කිසිවක් ලබාදී නොමැති බව පවසා සිටින ලදී. පොදු අධිකාරිය පවසා සිටියේ නියෝගයේ අවසානයේ එක් ඇමුණුමක් ඇති බවත් පවසා සිටින ලදී. අභියාචක පවසා සිටියේ ලබා දී ඇති නියෝගය ප්‍රකාරව අවම වශයෙන් ඇමුණුම් 3ක් හෝ පැවතිය යුතු බවයි.

**නියෝගය:**

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 3 වගන්තිය ප්‍රකාරව පොදු අධිකාරිය සන්තකයේ, භාරයේ හෝ පාලනයේ ඇති මෙම නියෝගයේ සඳහන් කර ඇති ඇමුණුම් අභියාචක වෙත ලබා දීමට නියෝග කර සිටිමු. තවද එම ඇමුණුම් තම සන්තකයේ, භාරයේ හෝ පාලනයේ නොමැති නම් එසේ පැහැදිලිව සඳහන් කරන ලෙසටත් නියෝග කර සිටිමු.
කොමිෂන් සභා රීතින්හි, රීති අංක 27 (ගාස්තු හා අභියාචනා කාර්යපටිපාටිය, ගැසට් අංක 2004/66, 2017.02.03) ප්‍රකාරව මෙම නියෝගය දෙපාර්ශවය වෙත සන්නිවේදනය කිරීමට නියෝග කර සිටිමු. අභියාචනය මෙසේ අවසන් කරනු ලැබේ.

*****